රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2023.12.07

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ

අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු

වෙබ් අඩවි කර්තෘ

<u>මාධ්‍ය නිවේදනය</u>

අනුරාධපුර ඓතිහාසික අවුකන බුද්ධ ප්‍රතිමාවට සිවුරක් පැළඳවීම සම්බන්ධයෙන් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් (වැඩබලන) කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ මහත්මිය විසින් මා වෙත එවන ලද මාධ්‍ය නිවේදනය අවශ්‍ය ප්‍රචාරක කටයුතු සඳහා ඔබ වෙත එවමි.

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.

දු තො T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk

www.dgi.gov.lk
www.news.lk

මාධ්‍ය නිවේදනය

අනුරාධපුර ඓතිහාසික අවුකන බුද්ධ ප්‍රතිමාවට සිවුරක් පැළඳවීමට අදාළ පුරවිද්‍යා දෙපාර්තමේන්තුවේ තොරතුරු පැහැදිලි කිරීමේ මාධ්‍ය නිවේදනය

2023.11. 26 පොහෝය දින ඓතිහාසික බුද්ධ ප්‍රතිමාවට සිවුරක් පැළඳවීම පිළිබඳව සමාජ මාධ්‍ය ජාලා ඡායා රූප සහිතව ප්‍රවෘත්තියක් පළ කළ අතර එය සමාජයේ මහත් කතා බහට ලක් වූ කාරණයක් විය.

02. මෙම ප්‍රවෘත්තියට අදාළව අනුරාධපුර සහකාර පුරාවිද්‍යා අධ්‍යක්ෂ වෙතින් අප විසින් ඉතා කඩිනමින් වාර්තාවක් කැඳවන ලදි.

03. ඒ අනුව ඓතිහාසික අවුකන බුද්ධ ප්‍රතිමාව ආශ්‍රිත ස්ථානීය පරීක්ෂාවක් සිදු කොට ඇති අතර මේ පිළිබඳව අවුකන රාජමහා විහාරයේ විහාරාධිපති හිමියන්ගෙන් ප්‍රකාශයක් ලබා ගෙන ඇත.

04. " විහාරස්ථානයේ වාර්ෂිකව පැවැත්වෙන කඨින පූජෝත්සවය වෙනුවෙන් පිළිම වහනසේට පැය කිහිපයකට සිවුරක් අන්දවා පූජා පැවැත්වීමට තමන් වහන්සේ කටයුතු කළේය.." යනුවෙන් විහාරාධිපති හිමියන් පවසා ඇත.

වැඩිදුරටත් උන් වහන්සේ පවසා ඇත්තේ ,

" තමන් වහන්සේගේ අනුදැනුම මත සිදු වූ මෙම පූජාව කිසිදු ආකාරයකින් බුදු පිළිමයට හෝ අනෙක් පුරාවිද්‍යා ස්මාරකවලට හානියක් කිරීමේ අරමුණින් සිදු නොකළ බවත්.."ය.

එමෙන්ම මෙම කඨින පූජාව වෙනුවෙන් සිවුරක් පැළඳවීම පිළිබඳ කල්වේලා ඇතිව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට නොහැකි වූ බවත් පවසා තිබේ. එමෙන්ම මෙය අනවබෝධයෙන් සිදු වූ කටයුත්තක් බව තවදුරටත් උන්වහන්සේ පිළිගත් හ.

05. කලාප භාර පුරාවිද්‍යා නිළධාරීන්ගේ වාර්තාව අනුව ( ස්ථාන පරීක්ෂාව අනුව ) අවුකන ඓතිහාසික බුද්ධ ප්‍රතිමාවට හෝ ඒ අවට පුරාවිද්‍යා සාධකවලට කිසිදු භෞතික හානියක් සිදුව නොමැත.

06. මින් ඉදිරියට මෙවැනි ක්‍රියාවක් සිදු කරන්නේ නම් අනිවාර්යෙන්ම පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව ,ලිඛිත අවසරයක් ලබා ගත යුතු බවත් එසේ නොවුනහොත් නීති මගින් කටයුතු කරන බවටත් උන් වහන්සේට දන්වා ඇත.

07. මේ සම්බන්ධව මේ වනවිටත් ගල්නෑව පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ගොනු කර තිබේ.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව